**සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක 26/2026**

මගේ අංකය :- PPSC/ES/04/FI/6/3/3
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
සබරගමුව පළාත
පළාත් සභා කාර්යාල සංකීර්ණය
නව නගරය, රත්නපුර.
2026.07. 23

සබරගමුව පළාත් සභාවේ,

01. ප්‍රධාන ලේකම්
02. ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්
03. පළාත් පාලන කොමසාරිස්
04. සහකාර පළාත් පාලන කොමසාරිස්, රත්නපුර/කෑගල්ල.
05. සියලුම පළාත් පාලන ආයතන ප්‍රධානීන්

## සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල පුස්තකාලයාධිපති III වැනි ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2026

සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2014 නොවැම්බර් 19 දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුමත කරන ලද සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල පුස්තකාලයාධිපති තනතුර සඳහා වන සේවා ව්‍යවස්ථාවෙහි සහ එම ව්‍යවස්ථාවේ 2019.05.08 දිනැති සංශෝධිත පත්‍රිකා අංක 01 හි හා 2025.09.08 දිනැති සංශෝධිත පත්‍රිකා අංක 02 හි විධිවිධාන අනුව සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පුස්තකාලයාධිපති III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම චක්‍රලේඛයේ පිටපතක් සබරගමුව පළාත් සභා නිල වෙබ් අඩවියේ (www.sg.gov.lk) හා සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා නිල වෙබ් අඩවියේ (www.psc.sg.gov.lk) පළ කර ඇත. මෙම චක්‍රලේඛය ඔබ ආයතනය යටතේ සේවය කරන සුදුසුකම්ලත් නිලධාරීන්ගේ දැනගැනීම සඳහා වහාම යොමු කරන්න.

1.0 මෙම විභාගය රත්නපුර නගරය තුළ පමණක් පැවැත්වේ. මෙම විභාගය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වෙන දිනය යථා කාලයේදී දන්වනු ඇත. මෙම විභාගයේ ප්‍රතිඵල අනුව ඉහළම ලකුණු ලබා සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්, සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල පුස්තකාලයාධිපති III වැනි ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරා ගනු ඇත.

2.0 මෙම සීමිත තරඟ විභාගය මඟින් සම්පූර්ණ කරනු ලබන **පුරප්පාඩු සංඛ්‍යාව 11කි.** පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. සීමිත තරඟ විභාගය මඟින් පිරවීමට නියමිත පුරප්පාඩුවලට ප්‍රමාණවත් අයදුම්කරුවන් නොසිටින්නේ නම් එම පුරප්පාඩු ද, විවෘත විභාගයේ ප්‍රතිඵල අනුව අනුපිළිවෙළට පුරවනු ලැබේ. මෙම බඳවා ගැනීමේ නිවේදනය අනුව පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම සම්බන්ධයෙන් අවසන් තීරණය ගැනීම මෙම කොමිෂන් සභාව සතුවේ.

3.0 වැටුප : අංක 10/2025 හා 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි II වන උපලේඛනය අනුව පුස්තකාලයාධිපති III වැනි ශ්‍රේණියට අදාළ වැටුප් කාණ්ඩය MN 3-2025 වන අතර මාසික වැටුප් පරිමාණය රු. 52,250 - 10×800 - 11×1,190 - 10×1,320 - 10×1,350 - රු.100,040/= වේ.

4.0 **සේවා කොන්දේසි :**

(i) සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල පුස්තකාලයාධිපති III වැනි ශ්‍රේණියේ තනතුරට පත්කරනු ලබන නිලධාරියකු පත්වීමේ දින සිට එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත් වේ. සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල පුස්තකාලයාධිපති තනතුර සඳහා වන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් අවශ්‍යතාවයන් සම්පූර්ණ කළ පසු සේවයේ ස්ථිර කිරීම සිදු කරනු ලැබේ.

(ii) මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත් කරන ලද අයදුම්කරුවන් ස්ථාන මාරු කිරීමටත් සබරගමුව පළාත තුළ ඕනෑම සේවා ස්ථානයකට පත් කිරීමටත් යටත් වේ.

(iii) පත්වීම ලැබී වසර 05 ක් ගතවීමට පෙර 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 පරිදි දෙවන රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

5.0 **සුදුසුකම්** :- සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල පුස්තකාලයාධිපති III වැනි ශ්‍රේණියේ තනතුරට සීමිත පදනම මත බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

(අ) අධ්‍යාපන සුදුසුකම්

අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී භාෂාව හා ගණිතය ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් (02) සහිතව විෂයයන් හයකින් (06) සමත්වීම.

(ආ) වෘත්තීය සුදුසුකම්

(i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක පුස්තකාල විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවේ පළමු වසර සමත්ව තිබීම.

හෝ

(ii) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවේ පළමු වසර සමත්ව තිබීම.

(ඇ) පළපුරුද්ද

(i) සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය (PL 01-2025) සඳහා වන සේවා ව්‍යවස්ථාවේ සඳහන් තනතුරක ස්ථිර පත්වීමක් ලබා තනතුරේ ස්ථිර කර තිබීම සහ එම තනතුරේ වසර 10ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

(ii). ඉහත 5.0 (ආ) වෘත්තිය සුදුසුකම් යටතේ දක්වා ඇති ඩිප්ලෝමා පාඨමාලාවලින් එකක් හෝ සම්පූර්ණ කර ඩිප්ලෝමා සහතිකය ලබා ඇත්නම් එම අපේක්ෂකයින් සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතනවල ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණය (PL 01 - 2025) සඳහා වන සේවා ව්‍යවස්ථාවේ සඳහන් තනතුරක සේවය ස්ථිර කර තිබීම සහ මෙම නිවේදනයේ සඳහන් වන නියමිත දිනට එම තනතුරේ පූර්වාසන්න වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම ප්‍රමාණවත් වේ.

(ඈ) කායික සුදුසුකම්

සෑම අපේක්ෂකයෙකුම සබරගමුව පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(ඉ) වෙනත්

(i) සබරගමුව පළාත් සභා බල ප්‍රදේශය තුළ අවම වශයෙන් වසර තුනක (03) ස්ථිර පදිංචියක් ඇති ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(iii)අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන නියමිත දිනට පූර්වාසන්න වසර පහ(05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු අතර, ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.

සටහන :

(i) සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් 2026.08.25 වැනි දින හෝ ඊට පෙර හෝ සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

(ii) ඉහත (ආ)හි සඳහන් අවුරුදු 05ක සතුටුදායක සේවය පහත සඳහන් පදනම මත තීරණය කරනු ලැබේ. පහත සඳහන් අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ඇති අය මෙම විභාගයේ කාර්යයන් සඳහා සතුටුදායක සේවයක් ඇති අයදුම්කරුවන් / අයදුම්කාරියන් සේ සළකනු ලැබේ.

(අ) 2026.08.25 දිනට පූර්වාසන්න පස් (05) අවුරුදු කාලය තුලදී ලැබෙන සියලුම වැටුප් වර්ධක උපයා ගෙන තිබීම.

(ආ) 2026.08.25 දිනට පෙර වර්ෂ 05 ක් තුළදී කිසිදු විනයානුකූල දඬුවමකට යටත් කර නොතිබීම. (අවවාද කිරීම් හැර)

## 6.0 විභාග පරිපාටිය :

මෙම ලිඛිත විභාගය සිංහල හා දෙමළ මාධ්‍යවලින් පමණක් පැවැත්වේ. අපේක්ෂකයන්ට සිය මනාපය පරිදි මින් එක් භාෂා මාධ්‍යයකින් පමණක් මෙම විභාගයට පෙනී සිටිය හැකි අතර ඉල්ලුම් කරන ලද මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. මෙම විභාගය පහත පරිදි ලිඛිත ප්‍රශ්න පත්‍ර තුනකින් සමන්විත වේ.

| ප්‍රශ්න පත්‍රය/විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| පුස්තකාල විද්‍යාව (ලිඛිත ප්‍රශ්න පත්‍රයකි) | පැය 03 | 100 | 40% |
| බුද්ධි පරීක්ෂණය (ලිඛිත ප්‍රශ්න පත්‍රයකි) | පැය 01 | 100 | 40% |
| සාමාන්‍ය දැනීම (ලිඛිත ප්‍රශ්න පත්‍රයකි) | පැය 01 | 100 | 40% |

එම විෂයන්ට අදාළ විෂය නිර්දේශය පහත පරිදි වේ.

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 6.1 පුස්තකාල විද්‍යාව | **(1) පුස්තකාල හා පුස්තකාලයාධිපතිත්වය**<br>(අ) පුස්තකාල හා පුස්තකාල ඉතිහාසය<br>(ආ) පුස්තකාලයන්හි සාමාජික කාර්ය භාරය<br>(ඇ) පොත් සහ විවිධ ලේඛන හා ලේඛන මුද්‍රිත නොවන මාධ්‍යයන්හි ආරම්භය හා විකාශනය<br>(ඈ) විද්වත් වෘත්තීය සංගම්<br>(i) ශ්‍රී ලංකා පුස්තකාල සංගමය<br>(ii) ඇමරිකානු හා බ්‍රිතාන්‍ය පුස්තකාල සංගම්<br>(ඉ) පුස්තකාල වර්ග<br>(i) පාසල් හා විද්‍යායතන පුස්තකාල<br>(ii) රජයේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු පුස්තකාල<br>(iii) මහජන පුස්තකාල<br>(ඊ) පුස්තකාල කමිටු<br>(උ) සංරක්ෂණය (Conservation) සහ ආරක්ෂණය (Preservation)<br>**(2) දැනුම හා තොරතුරු සංවිධානය**<br>(අ) ග්‍රන්ථ වර්ගීකරණය, එහි අරමුණු සහ ප්‍රයෝජන<br>(ආ) ග්‍රන්ථ වර්ගීකරණයක මූලිකාංග<br>(ඇ) දශම වර්ගීකරණය<br>(ඈ) සූචිකරණය, එහි අරමුණු<br>(ඉ) AACR 2 සූචිකරණ නීති සංග්‍රහය<br>(ඊ) සංලේඛය හා ග්‍රන්ථ විස්තරය<br>(උ) සූචි වර්ග<br>**(3) පුස්තකාල සම්පත් හා තොරතුරු සේවා**<br>(අ) විවිධ පුස්තකාල සම්පත්<br>(ආ) පුස්තකාල සම්පත් තේරීම හා තේරීමේ ක්‍රියාවලිය<br>(ඇ) ප්‍රතිග්‍රහණය හා ප්‍රතිග්‍රහණ ක්‍රියාවලිය<br>(ඈ) පිරිසැකසුම්කරණය<br>(ඉ) තොග සමීක්ෂණය සහ අපහරණ ක්‍රියාවලිය<br>**(4) තොරතුරු සන්නිවේදන තාක්ෂණය**<br>(අ) පුස්තකාල සේවාවන් කෙරෙහි පරිගණක තාක්ෂණයේ බලපෑම |
| 6.2 බුද්ධි පරීක්ෂණය | පද සංඛ්‍යා හා රූප වශයෙන් ඉදිරිපත් කරනු ලබන ගැටළු සම්බන්ධයෙන් අපේක්ෂකයන් දක්වන නිගමන හා ප්‍රතිචාර ආශ්‍රයෙන් එම ගැටළු පිළිබඳ අර්ථාවබෝධය, ප්‍රමාණීකරණය, කාලය හා අවකාශය අතර සහසම්බන්ධතා වටහා ගැනීමෙහිලා අපේක්ෂකයකු සතු හැකියාව මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. |
| 6.3 සාමාන්‍ය දැනීම | ජාතික, කලාපීය හා සමස්ථ ලෝකයේ විවිධ සංවිධාන පරිසරයක් තුළ මෙන්ම ලාංකික සමාජය තුළ පවත්නා සමාජයීය, සංස්කෘතික, අධ්‍යාපනික, දේශපාලනික, ආර්ථික හා අදාළ වෙනත් සාධකයන් සම්බන්ධයෙන් ද, පුස්තකාල විෂය හා පුස්තකාල ක්ෂේත්‍රය සම්බන්ධව සාමාන්‍ය දැනුම පිළිබඳව ද අපේක්ෂකයාගේ දැනුවත්භාවය හා අවබෝධය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ |

❖ පත්වීම් සඳහා සුදුසුකම් ලැබීමට එක් එක් විෂය සඳහා වෙන්කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතලිහක් බැගින්වත් (40%) අපේක්ෂකයකු විසින් ලබාගත යුතුවන අතර, සීමිත තරඟ විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙළ පදනම් කර ගනිමින් පත්වීම් ලබා දෙනු ලැබේ.

## 7.0 විභාග ගාස්තු :

විභාග ගාස්තුව රු.600/=කි. එම විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට/ දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. **එම විභාග ගාස්තුව ගෙවිය යුත්තේ සබරගමුව පළාත් සභා ආදායම් ශීර්ෂ 20.03.02.99 ට බැරවන ලෙසය.** ගෙවනු ලබන විභාග ගාස්තුව කිසිදු හේතුවක් මත ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම්, මුද්දර භාරගනු නොලැබේ. මුදල් ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගත යුතුවේ.

## 8.0 අයදුම්පත්‍ර :

ඒ 4 ( සාමාන්‍ය හාෆ්ෂීට් ) ප්‍රමාණයේ කඩදාසි භාවිතා කරමින්,

(අ) අංක 01 සිට 04 තෙක් ඡේදයන් පළමුවන පිටුවටද,
(ආ) අංක 05 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලටද, ඇතුළත් වන සේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු අතර අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂාවෙන් තම අත් අකුරින්ම පැහැදිළිව අයදුම්පත්‍රය පිරවිය යුතුය.

(ඇ) අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසිපරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම් පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුවේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

8.1 නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයදුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරඟ විභාගයට පෙනී සිටීමට සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩදෙනු ලැබේ. තරඟ විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

8.2 මෙම විභාගයේ ප්‍රතිඵල මත අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවන අතර එහිදී නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. අයදුම්කරු විසින් විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

8.3 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පුස්තකාලයාධිපති III වැනි ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය -2026"** යන්න හා ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය සඳහන් කරන්න.

9.0 අයදුම්පත නිවැරදිව හා පැහැදිළිව සම්පූර්ණ කර තමන් සේවය කරන ආයතන ප්‍රධානියා මාර්ගයෙන් 2026.08.25 වන දිනට හෝ ඊට පෙර **" ලේකම්, සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, සබරගමුව පළාත් සභා සංකීර්ණය, නවනගරය, රත්නපුර"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, ඒ සඳහා ස්වකීය අයදුම්පත් ආයතන ප්‍රධානීන් වෙත කල් ඇතුව ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන් / අයදුම්කාරියන් වෙත දන්වා සිටිනු ලැබේ.

10.0 පත්වීම සඳහා අයදුම්කරු / අයදුම්කාරිය තෝරාගනු ලැබී නම් ඔහු / ඇය මුදා හැරීමට ආයතන ප්‍රධානියා කැමති විය යුතුය. අයදුම්පතේ අගට යොදා ඇති අත්දමේ සහතිකයක් ආයතන ප්‍රධානියා විසින් ලබාදිය යුතුය. විභාගය පවත්වන බලධරයා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි ආයතන ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබාදිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

11.0 අපේක්ෂකයන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

I. වලංගු ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

12.0 **ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්**

ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසු හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

13.0 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාගය පවත්වන බලධරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත්වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාගය පවත්වන බලධරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

14.0 මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

එස්.පී.කේ.බෝධිමාන්න
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

එස්.පී.කේ. බෝධිමාන්න
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

ආදර්ශ අයදුම් පත්‍රය

## සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ පුස්තකාලයාධිපති III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2026

## Limited Competitive Examination for Recruitment to Grade III Of the Sabaragamuwa Provincial Public Librarians' Service - 2026

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
සිංහල - 1 දෙමළ - 2
(කොටුව තුළ අදාළ අංකය ලියන්න)

1.0 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම ..............................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : PERERA, A.B.C

1.2 සම්පූර්ණ නම ..............................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම ( සිංහලෙන් / දෙමළෙන්) ..............................................................................

..............................................................................

2.0 2.1 කාර්යාලයේ /දෙපාර්තමේන්තුවේ / ආයතනයේ නම හා ලිපිනය ..............................................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..............................................................................

2.2 කාර්යාලයේ /දෙපාර්තමේන්තුවේ / ආයතනයේ නම හා ලිපිනය (සිංහලෙන් / දෙමළෙන්)

..............................................................................

2.3 දුරකථන අංකය - පෞද්ගලික..............................................................................
කාර්යාලය..............................................................................

3.0 3.1 ස්ත්‍රී/ පුරුෂ භාවය - ..............................................................................

3.2 උපන්දිනය වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

3.3 ජාතික හැඳුනුම්පත් අංකය | | | | | | | | | | | | |

4.0 සේවා විස්තරය

4.1 ඔබ දැනට සේවය කරන ආයතනයේ නම :..............................................................................

..............................................................................

4.2 දැනට දරන තනතුරේ පදවි නාමය ..............................................................................
4.3 දැනට දරන තනතුරට පත්වූ දිනය ..............................................................................
4.4 දැනට දරන තනතුරෙහි සේවය ස්ථිර කර තිබේද යන වග ..............................................
4.5 සේවය ස්ථිර කර තිබේ නම් ස්ථිර කිරීම සඳහා යෝග්‍යතා ලැබූ දිනය ..............................
4.6 දැනට සේවය ස්ථිර කරමින් නිකුත් කරන ලද ලිපියේ යොමු අංකය හා දිනය ..................

..............................................................................
(ස්ථිර කිරීමේ ලිපියේ පිටපතක් අමුණන්න)

5.0 අධ්‍යාපන සුදුසුකම්

5.1 අ.පො.ස(සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර :
පළමු වර (සහතිකයේ පිටපතක් අමුණන්න)

I . විභාගයේ වර්ෂය හා මාසය :......................................
II. විභාග අංකය : ..........................................
III. ප්‍රතිඵල

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1 | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

දෙවන වර (අදාළවේ නම් සහතිකයේ පිටපතක් අමුණන්න)

I. විභාගයේ වර්ෂය හා මාසය :...........................................................................
II. විභාග අංකය :..........................................
III. ප්‍රතිඵල:

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1 | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

5.2 විභාග නිවේදනයේ 5.0 (ආ) යටතේ දක්වා ඇති පරිදි මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලැබීම සඳහා ඔබ පළමු වසර සමත් වී ඇති පුස්තකාල විද්‍යාව සම්බන්ධ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව පිළිබඳ විස්තර : (අදාළ සහතිකයේ පිටපතක් අමුණන්න )

I. ලබා ඇති ඩිප්ලෝමාව: ........................................................................................
II. එම ඩිප්ලෝමාව ලබාගත් විශ්ව විද්‍යාලය / ආයතනය: ..........................................
.................................................................................................................
III. එම ඩිප්ලෝමාවේ පළමු වසර සමත් වූ වර්ෂය: ..........................................
IV. අදාළ ඩිප්ලෝමාව සම්පූර්ණ කර තිබේ ද? ඔව්/නැත

6.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :....................................................................
(ii) ලදුපතේ අංකය හා දිනය: ..............................................................................
(iii) ගෙවූ මුදල: ...........................................................................................

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න
*( ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)*

7.0 අයදුම්කරුගේ සහතිකය

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත්, ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ /හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වෙමි. තවද, මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරනු ලබන මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

(ඈ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාගය පවත්වන බලධරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

......................................... ........................................

දිනය අයදුම්කරුගේ අත්සන

8.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන........................................................ මයා/මිය/මෙනවිය මාගේ කාර්යාලයේ නිලධාරියකු/නිලධාරිනියක සහ මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ....................................... දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

............................................ .........................................................

දිනය සහතික කරන නිලධාරියාගේ අත්සන

නම.....................................................
තනතුර...............................................
ලිපිනය...............................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

9.0 ආයතන ප්‍රධානියාගේ සහතිකය

(අ) මෙම අයදුම්කරු/අයදුම්කාරිය වන ....................................................................... මහතා/ මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවයේ නියුක්ත අයෙකු බවද,

(ආ) ඔහු/ඇය ......................................................................... තනතුරෙහි ස්ථිර කර ඇති බවද 2026.08.25 වන දිනට එම තනතුරෙහි වසර 05/10ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බවද,

(ඇ) ..................................................................... තනතුරෙහි සේවය ස්ථිර කරමින් ලිපියක් ඔහුට/ඇයට නිකුත් කර ඇති බවද,

(ඈ) ඔහු/ඇය 2026.08.25 දිනට හෝ ඊට පෙර යටත් පිරිසෙයින් අවුරුදු 05ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බවද,

(ඉ) ඔහු /ඇය අවවාද කිරීම් හැර කිසිදු විනය දඬුවමකට භාජනය වී නොමැති බවද, 2026.08.25 දිනට පූර්වාසන්න වසර 05ක් ඇතුළත ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායකව පැවති බවද,

(ඊ) ඔහු/ඇය ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට උපයාගත යුතු සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇති බවද,

(උ) ඉහත තනතුර සඳහා ඔහු/ඇය තෝරා ගතහොත් අයදුම්කරු දැනට දරණ තනතුරෙන් මුදා හැරිය හැකි බවද,

(ඌ) ඔහුගේ/ඇයගේ අයදුම්පතෙහි දැක්වෙන විස්තර මෙම ආයතනයේ ඇති ලේඛන සමඟ හරි වැරදි බලා ඇති බව සහ මෙම විභාගයට අදාළ විභාග නිවේදනයේ දැක්වෙන රෙගුලාසි අනුව මෙම විභාගයට පෙනී සිටීමට ඔහු /ඇය සුදුසු බවද සහතික කරමි.

..................................................................

ආයතන ප්‍රධානියා හෝ බලය
පවරනු ලබන නිලධාරියාගේ අත්සන

නම....................................................
පදවිය................................................
ලිපිනය..............................................
දිනය..................................................

සටහන :

(1) ආයතන ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් අත්සන් කිරීමට නිසි ආකාර බලතල පවරනු ලැබූ මාණ්ඩලික නිලධාරියකු හෝ විසින් පමණක් මෙම සහතිකය අත්සන් කළ යුතුය. සහතිකයේ අඩංගු කරුණු සෑම අයුරකින්ම නිවැරදි බවට සහතිකය නිකුත් කරන නිලධාරියා සෑහීමකට පත්විය යුතුය.

(2) යෝග්‍යතාවය පිළිබඳ සියලුම අවශ්‍යතාවයන් සම්පූර්ණ නොකරන අයදුම්කරුවන් වෙතොත් ඔවුන්ගේ අයදුම්පත් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකළ යුතුය.